# ජනගහන තොරතුරු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ISSN 2012-7057

ජනගහනය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ මූලික මූලාශ්‍රය වන්නේ ජන සංගණනයන්ය. ඒ හැරුණු විට සංගණන දත්ත පදනම් කරගත් ඇස්තමේන්තු හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ජීව සංඛ්‍යාති (උපත් හා මරණ ) මේ සඳහා උපයෝගී කර ගැනේ. ශ්‍රී ලංකාවේ මුල්ම සංගණනය 1871 දී සිදුවූ අතර අවස්ථා කිහිපයකදී හැර ඉන්පසු සෑම අවුරුදු දහයකට වරක්ම සංගණනයක් පවත්වා ඇත. නමුත් රටේ පැවැති අයහපත් වාතාවරණය නිසා 2001 දී සංගණනය පවත්වනු ලැබුයේ වසර 20 කට පසුවය. මෙහිදී ගණන්ගැනීම සිදුකරන ලද්දේ දිස්ත්‍රික්ක 18 ක පමණක් වන අතර උතුරු නැගෙනහිර පළාත්වලින් අම්පාර දිස්ත්‍රික්කය පමණක් හා අනිකුත් පළාත්වල සියලුම දිස්ත්‍රික්ක ඊට ඇතුලත්වේ. එම දිස්ත්‍රික්ක 18 සඳහා ජනගහනය මිලියන 16.9 ක් ලෙසද, සංගණනය සිදු නොකල ප්‍රදේශ සඳහා ද ඇස්තමේන්තු සකස්කිරීමෙන් පසු 2001 දී ශ්‍රී ලංකාව සඳහා මුළු ජනගහනය මිලියන 18.8 ක් ලෙස ද ප්‍රකාශයට පත්කර ඇත.

මෙම වාර්තාවෙන් ශ්‍රී ලංකාවේ ජනගහනයේ වෙනස්වීම් රටාව, ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ හා ජීව සංඛ්‍යාති පිළිබඳ සාරාංශ තොරතුරු ඉදිරිපත් කර ඇත. 2008 වසර සඳහා ජනගහන තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු අනුව ද, අනිකුත් තොරතුරු 2001 සංගණන වාර්තාවට අනුව ද ඉදිරිපත් කර ඇත.

## ජනගහන වර්ධනයේ විචලනය

වගුව 01 - ජනගහනයේ ප්‍රමාණය හා වර්ධනය
1871-2001

| වසර | ජනගහනය (දහස්) | වාර්ෂික වර්ධන අනුපාතිකය |
|---|---|---|
| 1871 | 2,400.4 | - |
| 1881 | 2,759.8 | 1. 4 |
| 1891 | 3,007.8 | 0.9 |
| 1901 | 3,566.0 | 1.7 |
| 1911 | 4,106.4 | 1.4 |
| 1921 | 4,497.9 | 0.9 |
| 1931 | 5,306.9 | 1.7 |
| 1946 | 6,657.3 | 1.5 |
| 1953 | 8,097.9 | 2.8 |
| 1963 | 10,582.0 | 2.6 |
| 1971 | 12,689.9 | 2.2 |
| 1981 | 14,846.8 | 1.7 |
| 2001 | 18,797.3 | 1.2 |

19 වන ශතවර්ෂය තුල අනෙකුත් සංවර්ධනය වන රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේ ද ජනගහන වර්ධනය සිදුවූයේ අඩු වේගයකිනි. එම යුගයේ මෙරට විදේශ ආධිපත්‍යයට නතුව තිබූ අතර දියුණු සමාජ ආර්ථික මට්ටමක් හා සෞඛ්‍යය පහසුකම් නොතිබුණි. එම යුගයේ ඉහළ උපත් හා මරණ අනුපාතිකයන් වාර්තා වූ අතර 1871 හා 1901 අතර ජනගහන වර්ධනය සියයට 0.9 ක් හා 1.7 අතර පැවැතී ඇත. (වගුව 01)

මිලියන 3.6 ක ජනගහනයක් සමඟ 20 වන සියවස ආරම්භ කළ ශ්‍රී ලංකාව එම සියවස අවසානයේ දී මිලියන 18.8 ක ජනගහනයක් කරා ලඟාවී ඇත. 20 වන සියවසේ මැද භාගයේ දී ජනගහන වර්ධනයේ සැලකිය යුතු වෙනසක් දක්නට ලැබෙන්නේ මරණ අනුපාතිකයේ පහත වැටීමත් සමඟය. මෙම යුගයේදී රටේ පැවැති සමාජීය වාතාවරණය වෙනස්වීමත් සමඟ සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ වර්ධනයක් ඇතිවිය. මැලේරියා වැනි වසංගත රෝග පැතිරීම අඩුවීම නිසා මරණ අනුපාතිකය අඩුවූ නමුත් උපත් අනුපාතිකය ඉහළ මට්ටමක පැවැති නිසා ජනගහන වර්ධනය ඉහළ අගයක් ගෙන ඇත. 1946 සිට 1953 කාලය තුල වාර්ෂික වර්ධන අනුපාතිකයේ ඉහළම අගය ලෙස සියයට 2.8 ක් වාර්තා වී ඇත.

සටහන 01- ජනගහනයේ ප්‍රමාණය හා වර්ධනය 1871 - 2001




1960 දශකයේ සිට ජනගහන වර්ධනයේ මීළඟ අදියර, එනම් මරණ අනුපාතිකය මෙන්ම උපත් අනුපාතිකයේ සැලකිය යුතු අඩුවීමේ ප්‍රවණතාවයක් වාර්තා විය. මෙම දශකයේ දී ප්‍රචලිත වන පවුල් සැලසුම් ව්‍යාපාරයත් සමඟ උපත් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබේ. මේ අනුව 1963 දී 2.6 ක් ලෙස වාර්තා වූ වාර්ෂික වර්ධන අනුපාතිකය 2001 වන විට 1.2 තරම් වූ අගයක් කරා ලඟාවී ඇත. (වගුව -01)

සටහන 02 - දිස්ත්‍රික්ක අනුව ජනගහන ව්‍යාප්තිය




මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වගුව 02 - 2001 න් පසු ජනගහන වර්ධනය

| වර්ෂය | ජනගහනය (දහස්) | වර්ධන අනුපාතය (%) |
|---|---|---|
| 2001 | 18,797 | - |
| 2002 | 18,921 | 1.3 |
| 2003 | 19,173 | 1.2 |
| 2004 | 19,435 | 1.2 |
| 2005 | 19,644 | 1.1 |
| 2006* | 19,886 | 1.1 |
| 2007* | 20,010 | 1.1 |
| 2008* | 20,217 | 1.1 |

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වගුව 02 න් 2001 සංගණනයෙන් පසු 2008 දක්වා ඇස්තමේන්තු කරන ලද මධ්‍ය වාර්ෂික ජනගහනය දැක්වේ. මෙම කාලය තුල වර්ධන අනුපාතයේ විශාල වෙනසක් දක්නට නොලැබෙන අතර 2005 - 2008 දක්වා සියයට 1.1 ක මට්ටමේ පවතී.

## ජනගහන ව්‍යාප්තිය

දිස්ත්‍රික්ක අනුව සලකා බලන කල පිළිවෙලින් කොළඹ, ගම්පහ, කුරුණෑගල හා මහනුවර දිස්ත්‍රික්කයන් තුල ඉහල ජනගහන අගයන් පෙන්නුම් කෙරේ. (සටහන 02) තවද මුළු ජනගහනයෙන් සියයට 30 කට ආසන්න ප්‍රමාණයක් බස්නාහිර පළාතේ පදිංචි අයවේ. මෙම ඇස්තමේන්තු අනුව අඩුම ජනගහනය වාර්තා වන්නේ පිළිවෙලින් මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් හා වවුනියාව දිස්ත්‍රික්ක වලිනි.

2001 සංගණනයෙන් සම්පූර්ණයෙන් ආවරණය කිරීමට හැකිවූ දිස්ත්‍රික්ක 18 සඳහා ජනගහනය 16,929,689 කි. මේ දිස්ත්‍රික්ක 18 අතුරින් උතුරු හා නැගෙනහිර පළාත්වලට අයත් වන්නේ අම්පාර දිස්ත්‍රික්කය පමණි. එයින් මිලියන 14 ප්‍රමාණයක් එනම් සියයට 82ක් පමණ සිංහල , මිලියන 1.6 දෙමළ හා මිලියන 1.3 පමණ මුස්ලිම් ජාතියට ද අයත්වේ. ආගම අනුව වර්ග කල විට සියයට 77 ක් පමණ බෞද්ධ වෙති. මේ අගයන් සමස්ත ශ්‍රී ලංකාවටම අදාල ප්‍රතිශතයන් නොවන බැව් අවධාරණය කරනු ලැබේ (වගුව 03 සහ වගුව 04).

සිතියම 01 - දිස්ත්‍රික්ක අනුව ජනගහන සනත්වය 2008




මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍ය වාර්ෂික ජනගහනය හා ජන හා නිවාස සංගණනය - 2001 දත්ත අනුව ඇස්තමේන්තු කර ඇත.

වගුව 03 - ජාතිය අනුව ජනගහන ව්‍යාප්තිය - 2001

| සිංහල | දෙමළ | මුස්ලිම් | බර්ගර් | වෙනත් | මුළු ගණන |
|---|---|---|---|---|---|
| 81.97 | 9.37 | 7.91 | 0.21 | 0.54 | 100 |

(සැ.යු. දිස්ත්‍රික් 18 සඳහා)

වගුව 04 - ආගම අනුව ජනගහන ව්‍යාප්තිය - 2001

| බෞද්ධ | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික ක්‍රිස්තියානි | වෙනත් | මුළු ගණන |
|---|---|---|---|---|---|
| 76.71 | 7.76 | 8.48 | 7.00 | 0.05 | 100 |

(සැ.යු. දිස්ත්‍රික් 18 සඳහා)

වගුව 05 - පදිංචි අංශය අනුව ජනගහන ව්‍යාප්තිය - 2001

| නාගරික | ග්‍රාමීය | වතු | මුළු ගණන |
|---|---|---|---|
| 14.57 | 80.02 | 5.40 | 100 |

(සැ.යු. දිස්ත්‍රික් 18 සඳහා)

මුළු ජනගහනයෙන් මිලියන 14 ක්, එනම් සියයට 80 ක් පමණ ග්‍රාමීය අංශයේ පදිංචි පුද්ගලයන් වේ (වගුව 05).

## ජනගහණ සනත්වය

වර්ග කිලෝමීටරයක පදිංචි පුද්ගලයින් ගණන ජනගහන සනත්වය ලෙස හඳුන්වනු ලැබේ. මෙය මුළු දිවයින සඳහා 2008 වසරේදී 322 ලෙසත් 1981 හා 2001 සංගණන වර්ෂවලදී පිළිවෙලින් 230 ක් හා 300 ලෙසත් වාර්තා වී ඇත. දිස්ත්‍රික්ක අනුව ජනගහන සනත්වයේ වෙනස්වීම් සිතියම 01 න් පෙන්නුම් කෙරේ. වියළි කලාපයට අයත් ප්‍රදේශවල අඩු සනත්වයක් ද කොළඹ දිස්ත්‍රික්කය හා බස්නාහිර පළාතට සම්බන්ධ අනිකුත් දිස්ත්‍රික්කවල ඉතා ඉහළ සනත්වයක් ද දැකිය හැක. අනෙකුත් ප්‍රදේශ අතරින් නුවර, ගාල්ල , යාපනය හා මාතර ප්‍රදේශ පිළිවෙලින් ඉහල අගයන් ගනී.

## සාක්ෂරතාවය

සාක්ෂරතාව යනු එදිනෙදා ජීවිතයේ භාවිතාවන සරල වාක්‍යයක අදහස තේරුම්ගත හැකි පරිදි කියවීමට හා ලිවීමට ඇති හැකියාව මැනීම පිලිබඳ මිනුමකි. 2008 දී ශ්‍රී ලාංකිකයන් ගේ සාක්ෂරතා අනුපාතය සියයට 91ක් වූ අතර ස්ත්‍රීන්ගේ සාක්ෂරතා අනුපාතය 1981 සිට 2008 කාලය තුල වඩා වැඩි ප්‍රතිශත ඒකක ගණනකින් ඉහළ ගොස් ඇති බව ද පෙන්නුම් කරයි (වගුව 06).

වගුව 06 - ස්ත්‍රී පුරුෂභාවය අනුව සාක්ෂරතා අනුපාතය

| වසර | සාක්ෂරතා අනුපාතිකය | | |
|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| 1981 | 87.4 | 91.5 | 83.2 |
| 2001 * | 91.1 | 92.6 | 89.7 |
| 2008 ** | 91.3 | 92.8 | 90.0 |

*දිස්ත්‍රික් 18 ක් සඳහා

** ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්තා (උතුරු නැගෙනහිර පළාත් හැර)

## වයස හා ස්ත්‍රී පුරුෂභාවය අනුව ජනගහනය

ජනගහනයේ වෙනස්වීම තීරණය කරනු ලබන ප්‍රධාන සාධක වන්නේ උපත්, මරණ හා සංක්‍රමණයයි. වයස හා ස්ත්‍රී පුරුෂභාවය මෙම සාධක වල වෙනස්වීම් අනුව රඳා පවතී. 2008 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද ජනගහනයෙන් සියයට 49.4 ක් පුරුෂයින් හා සියයට 50.6 ක් ස්ත්‍රීන් වේ.

වයස් පිරමීඩය අනුව ජනගහනයෙන් වැඩිම ප්‍රමාණයක් අයත්වන්නේ වසය 15-19 කාණ්ඩයට ය. එමෙන්ම සියයට 25කට වැඩි ප්‍රතිශතයක් වයස අවුරුදු 15 ට අඩු පුද්ගලයන් වන අතර ජනගහනයෙන් භාගයකට වැඩි ප්‍රතිශතයක් වයස අවුරුදු 30 ට අඩු අයවේ. තවද ජනගහනයෙන් සියයට 65 ක පමණ ප්‍රතිශතයක්, වයස අවුරුදු 15 ට වැඩි හා 60 ට අඩු වැඩ කරන වයසේ පුද්ගලයන් වන අතර සියයට 9 ක් වයස අවු. 60 ට වැඩි පුද්ගලයන්වේ (වගුව 07).

**සටහන 03 - ජනගහන පිරමීඩය - 2008**




**වගුව 07 - වයස හා ස්ත්‍රී පුරුෂභාවය අනුව ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය -2008**

| වයස් කාණ්ඩය | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| 0-4 | 8.5 | 8.7 | 8.3 |
| 5-9 | 8.8 | 9.0 | 8.6 |
| 10-14 | 9.0 | 9.2 | 8.8 |
| 15-19 | 9.7 | 9.9 | 9.5 |
| 20-24 | 9.4 | 9.5 | 9.3 |
| 25-29 | 7.9 | 7.8 | 8.0 |
| 30-34 | 7.6 | 7.6 | 7.7 |
| 35-39 | 7.5 | 7.4 | 7.5 |
| 40-44 | 6.9 | 6.9 | 6.9 |
| 45-49 | 6.0 | 6.0 | 6.1 |
| 50-54 | 5.5 | 5.4 | 5.5 |
| 55-59 | 4.0 | 3.8 | 4.1 |
| 60-64 | 2.9 | 2.9 | 3.0 |
| 65-69 | 2.4 | 2.2 | 2.5 |
| 70-74 | 1.8 | 1.7 | 1.9 |
| 75-79 | 1.2 | 1.1 | 1.2 |
| 80 + | 1.0 | 0.9 | 1.1 |

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍ය වාර්ෂික ජනගහනය හා ජන හා නිවාස සංගණනය - 2001 දත්ත අනුව ඇස්තමේන්තු කර ඇත.

## යැපෙන්නන්ගේ අනුපාතය

වයස අවු. 0-14 හා අවු. 60 ට වැඩි ජනගහනය, වැඩ කරන වයසේ ජනගහනයට (15-59) ට දක්වන අනුපාතය යැපෙන්නන්ගේ අනුපාතය ලෙස හැඳින්වේ. මෙම අනුපාතය 2001 වසර සඳහා සියයට 55.1 ක් ලෙස ගණනය කර ඇත. 2001 වසරේදී ප්‍රධාන වයස් කාණ්ඩ අනුව ජනගහනයේ ප්‍රතිශතය වගු 08 න් දැක්වේ.

**වගුව 08 - ප්‍රධාන වයස් කාණ්ඩ අනුව ජනගහනයේ ප්‍රතිශතය - 2001**

| වයස් කාණ්ඩය | ප්‍රතිශතය (%) |
|---|---|
| 0-14 | 26.3 |
| 15-59 | 64.5 |
| 60 + | 9. 2 |

## පුමිතිරි අනුපාතය

ජනගහනයේ ස්ත්‍රීන් සියයක් සඳහා පුරුෂයින්ගේ ගණන පුමිතිරි අනුපාතය ලෙස හැඳින්වේ. 2008 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍ය වාර්ෂික ජනගහනයට අනුව ඇස්තමේන්තු කරන ලද පුමිතිරි අනුපාතය 97.6 ක් වේ. 2001 සංගණන වර්ෂයේ දී පුමිතිරි අනුපාතය 99.1 ක් විය. නමුත් දිස්ත්‍රික්ක අනුව බලන කල වැඩිම පුමිතිරි අනුපාතය පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තාවේ. 2001 සංගණන වසරේදී ද මෙම දිස්ත්‍රික්කයෙන් වැඩිම පුමිතිරි අනුපාතය (103.9) වාර්තා වී තිබිණ.

**වගුව 09 - දිස්ත්‍රික්ක අනුව පුමිතිරි අනුපාතය 2008**

| දිස්ත්‍රික්කය | පුමිතිරි අනුපාතය |
|---|---|
| කොළඹ | 103.1 |
| ගම්පහ | 94.6 |
| කළුතර | 96.5 |
| මහනුවර | 94.0 |
| මාතලේ | 98.8 |
| නුවර එළිය | 97.1 |
| ගාල්ල | 93.8 |
| මාතර | 93.4 |
| හම්බන්තොට | 98. 9 |
| යාපනය | 90.2 |
| කිලිනොච්චිය | 102.7 |
| මන්නාරම | 108. 2 |
| වවුනියාව | 95. 3 |
| මුලතිව් | 93.6 |
| මඩකලපුව | 93.4 |
| අම්පාර | 96.2 |
| ත්‍රිකුණාමලය | 98. 4 |
| කුරුණෑගල | 96.5 |
| පුත්තලම | 97.4 |
| අනුරාධපුරය | 102.8 |
| පොළොන්නරුව | 108.3 |
| බදුල්ල | 97 .9 |
| මොණරාගල | 102. 8 |
| රත්නපුරය | 101.7 |
| කෑගල්ල | 94.9 |
| **ශ්‍රී ලංකාව** | 97.6 |

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍ය වාර්ෂික ජනගහනය හා ජන හා නිවාස සංගණනය - 2001 දත්ත අනුව ඇස්තමේන්තු කර ඇත.

## ජීව සංඛ්‍යාති

### දළ උපත් අනුපාතිකය

දළ උපත් අනුපාතිකය යනු වසරකට ජන සංඛ්‍යාවෙන් දහසකට සිදුවන සජීවී උපත් සංඛ්‍යාවයි. මෙය ජනගහනයේ වැඩිවීම නිර්ණනය කර ගත හැකි එක් දර්ශකයක් වේ. සටහන 04 අනුව 1960 දශකයේ දී 32 ක් පමණ වූ උපත් අනුපාතිකය, 1970, 1980 හා 1990 දශක වලදී ක්‍රමයෙන් අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන අතර වසර 1999 න් පසු නැවත වැඩිවීමක් දැකිය හැක (**සටහන** 04). 60 දශකයෙන් පසු ප්‍රචලිත වූ පවුල් සැලසුම් ක්‍රම භාවිතය ව්‍යාප්තිය හා කලින් සඳහන් කරන ලද සමාජ ආර්ථික වෙනස්වීම් උපත් අනුපාතිකය අඩුවීමට හේතු සාධක වන්නට ඇත.

**සටහන 04 - දළ උපත් අනුපාතිකය**




### දළ මරණ අනුපාතිකය

දළ මරණ අනුපාතිකය යනු වසරකට ජන සංඛ්‍යාවෙන් දහසකට එම වසර තුළ සිදුවන මරණ සංඛ්‍යාවයි. මෙය ද ජනගහන වර්ධනය නිර්ණනය කිරීමට යොදා ගන්නා එක් දර්ශකයකි.

1960 ගණන්වල ජන සංඛ්‍යාවෙන් දහසකට 6 – 8 අතර මට්ටමක පැවැති දළ මරණ අනුපාතිකය 2007 වනවිට 5.8 දක්වා අඩු වී ඇත (සටහන 05). 1960 දශකයේ සිට රජයේ සුභසාධන වැඩපිළිවෙලවල් දියත් කිරීම නිසා මැලේරියාව, කොලරාව වැනි රෝග පාලනය කිරීමට හැකිවීම දළ මරණ අනුපාතිකයේ අඩු වීමට හේතු වන්නට ඇත.

සටහන 05 - දළ මරණ අනුපාතිකය




## ළදරු මරණ අනුපාතිකය

60 දශකයේදී ජන සංඛ්‍යාවෙන් දහසකට 48 පමණ වූ මෙරට ළදරු මරණ අනුපාතිකය 1990 දශකය වන විට 14 – 19 අතර ප්‍රමාණයක් වූ අතර 2003 දී 11.2 ක් පමණ වී ඇති බව පෙනේ (සටහන 06). ඉහතින් දැක්වූ පරිදි සායන පහසුකම්, එන්නත්කරණය වැනි සෞඛ්‍ය ක්ෂෙත්‍රවල ඇතිවූ විශාල දියුණුව මාතෘ මෙන්ම ළදරු මරණ අනුපාතිකයේ අඩුවීම කෙරේ ද විශාල වශයෙන් බලපාන්නට ඇත. මීට අමතරව මෙම කාල වකවානුව තුල ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර මෙම දැනුවත්භාවය සමඟ එක්වූ ළමා ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරයේ සාර්ථකත්වය ළදරු මරණ සංඛ්‍යාවේ වාර්තාගත අඩුවීමක් කරා ළඟාවීමට ඉවහල් වන්නට ඇතැයි සිතිය හැක.

ශ්‍රී ලංකාවේ 2006/07 ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයට අනුව වයස මාස 12-23 දරුවන්ගෙන් සියයට 99 ක් ම උපතින් පසු මුල් අවුරුද්දේ ලබා දෙන ප්‍රධාන එන්නත් සියල්ලම ලබා ගෙන ඇති බව වාර්තා විය.

මෙම සමීක්ෂණයෙන් තව දුරටත් හෙළිවන කරුණු අනුව යහපත් සෞඛ්‍ය පුරුදු, දරුවන්ගේ පෝෂණ මට්ටම යහපත් මට්ටමක පැවතීම මෙන්ම මව් කිරි ලබා දුන් දරුවන්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතීම යනාදී කරුණු ද වාර්තා වී ඇති අතර එම කරුණු ද ළදරු මරණ ප්‍රතිශතයේ අඩුවීමට බලපෑ ප්‍රධාන සාධක අතර තිබිය හැක.

සටහන 06 - ළදරු මරණ අනුපාතිකයේ වෙනස්වීම් රටාව




මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## උපතේදී අපේක්ෂිත ආයු කාලය

සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ ඇති වූ දියුණුව නිසා උපතේ දී අපේක්ෂිත ආයු කාලය පසුගිය දශක කිහිපය තුල වර්ධනය වූ ආකාරය සටහන 7 න් දැක්වේ.
1946 දී අවු. 47 ක් වූ පුරුෂයින්ගේ සාමාන්‍ය ආයු කාලය 2001 වනවිට අවු. 69 ක් දක්වා ද කාන්තාවන්ගේ ආයු කාලය අවු. 45 සිට අවු. 77 දක්වාද සැලකිය යුතු අන්දමකින් වර්ධනය වී ඇත.

මෙය සමහර දියුණු රටවල අපේක්ෂිත ආයු කාලය තරමට සමාන කළ හැක. සෞඛ්‍යය මෙන්ම අධ්‍යාපන ක්ෂෙත්‍රයේ දියුණුව මෙයට ප්‍රධාන හේතු කාරකය විය හැකි අතර අනාගත ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහන ප්‍රතිශතය වැඩිවීමේ ප්‍රවනතාවක් ද

සටහන 07 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව උපතේදී අපේක්ෂිත ආයු කාලය (සංගණන වර්ෂ වලදී)




මූලාශ්‍රය: Life Tables for Sri Lanka and Districts, 2000-2002

## සාරතා අනුපාතිකය

පසුගිය දශක කීපය තුල ජනගහන වර්ධනයේ අඩුවීම විදහා දක්වන තවත් එක් සාධකයක් වනුයේ සාරතා අනුපාතිකය හෙවත් කාන්තාවකගේ ජීවිත කාලය තුල ඇයට ලැබිය හැකි දරුවන්ගේ සංඛ්‍යාව යි. 1975 – 1982 කාලය තුල සිදුවූ සුළු වැඩිවීමෙන් පසු 1987 සිට 2000 දක්වා කාලයේ දී සාරතා අනුපාතිකයේ සීඝ්‍ර අඩුවීමක් සිදුවී ඇත. එනම් 80 දශකයේ මුල් භාගයේ කාන්තාවකට සිටිය හැකි දරුවන් ගණන 3 ක් හෝ 4 ක් වූ අතර 2000 දශකය වන විට 1.2 දක්වා අඩු වී ඇත. 2006-07 ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයේ දී එහි නැවත වැඩිවීමේ උපනතියක් පෙන්නුම් කෙරේ.

සටහන 08 - සමීක්ෂණ වර්ෂවලදී සාරතා අනුපාතිකය




මූලාශ්‍රය:

| | |
|---|---|
| DHS | ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය |
| CPS | උපත්පාලන ක්‍රම භාවිතය පිළිබඳ සමීක්ෂණය |
| WFS | ලෝක සාරතා සමීක්ෂණය |

## ශ්‍රම බලකාය

ශ්‍රම බලකාය හෙවත් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මූලික වශයෙන් රැකියා නියුක්ත හා රැකියා වියුක්ත වශයෙන් කොටස් දෙකකි. 2008 දී මෙම ප්‍රමාණය මිලියන 8 ක් පමණ විය. ශ්‍රම බලකායට සහභාගීවීමේ අනුපාතිකය යනු ශ්‍රම බලකාය හෙවත් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය වයස අවුරුදු 10 ට වැඩි ජනගහනයට දක්වන ප්‍රතිශතය යි. ඒ අනුව පුරුෂයින්ගේ ශ්‍රම බලයට සහභාගීවීමේ අනුපාතිකය ස්ත්‍රීන්ගේ මෙන් දෙගුණයක් පමණවේ (වගුව 10).

## විරැකියා අනුපාතිකය

විරැකියා අනුපාතිකය යනු මුළු ශ්‍රමබලකායට රැකියා වියුක්ත පුද්ගලයින් දක්වන අනුපාතිකය යි. වගු අංක 10 ට අනුව 2008 වසරේදී විරැකියා අනුපාතිකය 5.4 ක් ලෙස වාර්තා වු නමුත් ස්ත්‍රීන්ගේ විරැකියා අනුපාතිකය 8.4 ක් තරම් ඉහල අගයක් ගනී. එනම් ස්ත්‍රීන්ගේ විරැකියා අනුපාතිකය පුරුෂයන්ගේ විරැකියා අනුපාතිකය ට වඩා වැඩිය.

වගුව 10 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රම බලය සහ ශ්‍රම බලයට සහභාගිවීමේ අනුපාතිකය හා විරැකියා අනුපාතිකය - 2008

| ස්ත්‍රී/පුරුෂ භාවය | මුළු ශ්‍රම බලයට අයත් සංඛ්‍යාව | රැකියා නියුක්ති සංඛ්‍යාව | ශ්‍රම බලයට සහභාගීවීමේ අනුපාතය | රැකියා වියුක්ති සංඛ්‍යාව | විරැකියා අනුපාතිකය |
|---|---|---|---|---|---|
| එකතුව | 8,081,702 | 7,648,305 | 49.5 | 433,397 | 5.4 |
| පුරුෂ | 5,227,427 | 5,033,449 | 67.8 | 193,978 | 3.7 |
| ස්ත්‍රී | 2,854,275 | 2,614,856 | 33.2 | 239,419 | 8.4 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය (උතුරු නැගෙනහිර පළාත් හැර)

**14 වන ජන හා නිවාස සංගණනය 2011 වසරේදී පැවැත්වේ.**

සංඛ්‍යාන තොරතුරු සඳහා
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංගණන අංශය, 16/7, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07. දු.ක 011-2689461/2
census@statistics.gov.lk